# 4 ආර්ථික ක්‍රම හා ආර්ථික සබඳතා

## 4.1 මූලික ආර්ථික ප්‍රශ්න හා ආර්ථික ක්‍රියා

### 4.1.1 මිනිස් අවශ්‍යතා හා වුවමනා හඳුනා ගැනීම

සමාජයක ජීවත්වන පුද්ගලයන්ට විවිධ අවශ්‍යතා ඇත. කෑමබීම, ඇඳුම් පැළඳුම්, නිවාස, රථ වාහන, බෙහෙත් ඒවායින් කිහිපයකි.

මිනිසාගේ පැවැත්මට අනිවාර්යයෙන් ම අවශ්‍ය දේ අවශ්‍යතා ලෙස හැඳින්වේ. ආහාරපාන, වාසස්ථාන, ඇඳුම් පැළඳුම් මූලික අවශ්‍යතා ලෙස සැලකේ.

වුවමනා යනු මිනිස් අවශ්‍යතා සපුරා ගැනීමට යොදා ගන්නා විවිධ ආකාර (ස්වරූප) වේ. වුවමනා අසීමිත වන අතර ඒවා දිනෙන් දින වර්ධනය වේ.

මිනිස් අවශ්‍යතා හා වුවමනා සම්පූර්ණ කර ගැනීමට භාණ්ඩ හා සේවා යොදා ගැනේ. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමට සම්පත් අවශ්‍ය වේ. සම්පත්වලින් ලබා ගත හැකි ප්‍රයෝජන එක් කාර්යයකට පමණක් සීමා නොවන අතර ඒවා විකල්ප ප්‍රයෝජන සහිත ය. එම නිසා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේ දී තෝරා ගැනීමක් කිරීමට සිදු වේ.

**ක්‍රියාකාරකම් 4.1**

- පහත වගුව සම්පූර්ණ කරන්න.

| අවශ්‍යතාව | වුවමනා |
|---|---|
| 1. ආහාරපාන | නිදසුන- බත්, පාන් ........................ |
| 2. වාසස්ථාන | ...................................................... |
| 3. ඇඳුම් පැළඳුම් | ...................................................... |

එක් එක් යුගවල දී පරිසරයේ ඇති සම්පත් යොදා ගෙන සිය අවශ්‍යතා ඉටුකර ගැනීමට මිනිසා සමත් විය. දඩයම් යුගය, එඬේර යුගය, ගොවි යුගය මෙසේ පසු කළ යුග අතර වැදගත් වේ. කාලය ගතවීමත් සමඟ මිනිස් වුවමනා ද සංකීර්ණ බවට පත් විය. මෙම වුවමනා ඉටුකිරීම සඳහා සීමිත සම්පත් යොදාගෙන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කර ගැනීමට සිදු විය.

### 4.1.2 භාණ්ඩ හා සේවා නිෂ්පාදනය

මිනිසාගේ අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා අතරින් ඇතැම් ඒවා ස්වාභාවික පරිසරයෙන් නොමිලේ (පිරිවැයක් නොදරා) ලබා ගනී. ඇතැම් ඒවා සඳහා පිරිවැයක් දැරීමට සිදු වේ. වාතය, හිරුඑළිය, වර්ෂා ජලය ආදිය ආයාසයෙන් තොර ව නොමිලේ ලැබේ. මේවා ද මිලක් (පිරිවැයක්) සහිත භාණ්ඩ බවට පත්වන අවස්ථා ඇත. හිරුඑළිය යොදාගෙන සූර්ය කෝෂ මඟින් විදුලිය නිපදවූ විටත්, වර්ෂා ජලය නළ මඟින් ලබාගන්නා විටත් ඒවා වටිනාකමක් ඇති භාණ්ඩ (ආර්ථික භාණ්ඩ) බවට පත්වේ.

ආර්ථික භාණ්ඩ නිෂ්පාදනය වන්නේ සමාජය තුළ සිදු වන නිෂ්පාදන ක්‍රියාවලියක් මඟිනි. නිෂ්පාදන ක්‍රියාවලියක් සිදුවීම සඳහා ආර්ථිකය මඟින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට යොදා ගන්නා නිෂ්පාදන සාධක හතරක් වේ.

1. භූමිය. 2. ශ්‍රමය. 3. ප්‍රාග්ධනය. 4. ව්‍යවසාය.

**භූමිය** - භූමිය යනුවෙන් අදහස් කරන්නේ පෘථිවි ගෝලය හා වායු ගෝලය ආශ්‍රිත ස්වාභාවික සම්පත් ය. ඒ අනුව සමාජයක් සතු ඉඩම්, ඛනිජ සම්පත්, ජල සම්පත, සත්ත්ව සම්පත ආදි සියල්ල මෙයට ඇතුළත් වේ. භූමියට ගෙවන මිල බදු කුලියයි.

**ශ්‍රමය** - යම් සමාජයක පුද්ගලයන් විසින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා යොදවනු ලබන කායික හා මානසික ශක්තිය ශ්‍රමය ලෙස හැඳින්වේ. කායික වශයෙන් කම්කරුවන්, පෙදරේරුවන්, ගොවීන් ආදීන් ශ්‍රමය සැපයීම කරන අතර වෛද්‍යවරු, ඉංජිනේරුවෝ, තාක්ෂණික ශිල්පීහු මානසික ශක්තිය වැය කරති. ශ්‍රමයට කරන ගෙවීම වැටුපයි.

**ප්‍රාග්ධනය** - ප්‍රාග්ධනය යනුවෙන් හඳුන්වනු ලබන්නේ මිනිසා විසින් නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගනු ලබන නිෂ්පාදන ආධාරක වේ. නිදසුන් ලෙස මෙවලම් හා උපකරණ, යන්ත්‍ර සූත්‍ර හා යන්ත්‍රාගාර, ජල සම්පාදන ක්‍රම, කර්මාන්ත ශාලා සහ නිෂ්පාදනයට යොදා ගන්නා ගොඩනැඟිලි ආදීය දැක්විය හැකි ය. ප්‍රාග්ධනය සඳහා පොළී ගෙවයි.

**ව්‍යවසාය** - මින් අදහස් කරන්නේ විසිරී පවත්නා නිෂ්පාදන සාධක ඒක රාශි කරමින් නිෂ්පාදන තීරණ ගැනීම, නිෂ්පාදන කටයුතු සංවිධානය හා මෙහෙයවීමයි. අනාගත අවදානම් දරමින් ව්‍යවසායකයා මෙම කටයුත්ත කරන අතර ඒ සඳහා ලාභ උපයයි.

### 4.1.3 මූලික ආර්ථික ප්‍රශ්න

සියලු ම මිනිස් අවශ්‍යතා හා වුවමනා සම්පූර්ණයෙන් ම සපුරා ගැනීමට සම්පත් ප්‍රමාණවත් මට්ටමක නොමැති වීම සෑම සමාජයකට ම බලපාන මූලික ගැටලුවකි. එය හිඟකම ලෙස හැඳින්වේ. සාපේක්ෂ අර්ථයෙන් සැලකෙන හිඟකම තුළින් පැනනඟින මූලික ආර්ථික ප්‍රශ්නවලට සෑම ආර්ථිකයක් ම පොදුවේ මුහුණ දේ. මූලික ආර්ථික ප්‍රශ්න තුනකි.

1. කුමක්, කොපමණ නිපදවනවා ද?

2. කෙසේ, කවුරුන් නිපදවනවා ද?

3. කවුරුන් සඳහා නිපදවනවා ද?

## 1. කුමක්, කොපමණ නිපදවනවා ද?

සමාජයකට මෙවැනි තීරණ ගැනීමට සිදු වේ.

අ. ඔබ පදිංචි ඉඩම පර්චස් 40 ක් යැයි සිතන්න. එම බිම් ප්‍රමාණය තුළ ඔබට කළ හැකි දේ මොනවා ද? ලැයිස්තුවක් සකස් කරන්න.

ආ. ඔබ වගා කිරීමට අදහස් කළේ යැයි සිතන්න. ඔබ වගා කිරීමට බලාපොරොත්තු වන දේ මොනවා ද?

ඇ. එසේ වගා කළ හැකි විවිධ දේ අතුරින් ඔබ තෝරා ගත් දේ කුමන ප්‍රමාණවලින් වගා කරනවා ද යන්න ඔබට තීරණය කිරීමට සිදු වුව හොත් ඔබ කරන්නේ කුමක් ද?

සම්පත් සැපයුම සීමිත නිසාත්, වුවමනාවන් අසීමිත නිසාත් කිසි ම සමාජයකට තම වුවමනාවන් මුළුමනින් ම සපුරා ලිය නො හැකි ය. ඒ නිසා සමාජයක් සමහර වුවමනාවන් පමණක් යම් ප්‍රමාණයකින් සම්පූර්ණ කර ගැනීමට ක්‍රියා කරයි. මේ නිසා මුලින් ම පැන නඟින ප්‍රශ්නය වන්නේ කුමන භාණ්ඩ කුමන ප්‍රමාණවලින් නිපදවනවා ද යන්න තීරණය කිරීමයි. ඒ අනුව ආහාර පාන, ඇඳුම් පැළඳුම් ආදී පාරිභෝගික භාණ්ඩ නිපදවීමට හෝ යන්ත්‍ර සූත්‍ර ගොඩනැඟිලි ආදි ප්‍රාග්ධන භාණ්ඩ නිපදවීමට පුළුවන. නොඑසේ නම් සුඛෝපභෝගී භාණ්ඩ නිපදවීමට පුළුවන. පාරිභෝගික හා ප්‍රාග්ධන භාණ්ඩවලින් යම් ප්‍රමාණය බැගින් නිපදවීමට ද පුළුවන. ඒ ඒ භාණ්ඩ කොපමණ ප්‍රමාණය බැගින් නිපදවන්නේ ද කියා තීරණ ගත යුතුයි. මෙම ප්‍රශ්නවලට පිළිතුරු සොයා ගත හැක්කේ ආර්ථිකය සංවිධානය වී ඇති ආකාරය අනුවයි.

## 2. කෙසේ, කවුරුන් නිපදවනවා ද?

පහත දක්වෙන රූපය අධ්‍යයනය කරන්න.



භාණ්ඩ හා සේවා නිෂ්පාදනය




රූප සටහන 4.1

රූප සටහනේ දැක්වෙන පරිදි නිෂ්පාදනයට ශ්‍රමය හා යන්ත්‍ර සූත්‍ර යොදාගත හැකි බවත්, නිෂ්පාදනය විවිධ පුද්ගලයන්ට හෝ ආයතනවලට පැවරීම සිදුවන ආකාරයත් විමසා බලමු.


කුමන භාණ්ඩ කුමන ප්‍රමාණවලින් නිපදවිය යුතු ද යන්න තීරණය කළ පසු ඊළඟට සමාජය මුහුණ දෙන්නේ කෙසේ ද යන ප්‍රශ්නයෙන් අදහස් වන්නේ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ශිල්පීය ක්‍රමයයි. මෙහි දී නිෂ්පාදනය සඳහා ශ්‍රමය යොදා ගන්නවා ද, ප්‍රාග්ධනය යොදා ගන්නවා ද නැතහොත් ශ්‍රමය හා ප්‍රාග්ධනය කුමන ප්‍රමාණවලින් යොදා ගන්නවා ද යන්න තීරණය කළ යුතුයි.

ආර්ථිකයක් සතු ශ්‍රම, සම්පත් හා ප්‍රාග්ධන සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලැබෙන පරිදි සුදුසු ශිල්පීය ක්‍රමය තීරණය කළ යුතුයි.

**කවුරුන් නිපදවනවා ද** යන්නෙන් අදහස් වන්නේ නිෂ්පාදන කටයුතු විවිධ පුද්ගලයන් හා සංවිධාන මඟින් කළ හැකි බවයි. ඒ අනුව නිෂ්පාදනය කරනුයේ රජය ද, පෞද්ගලික අංශය ද, පළාත් පාලන ආයතනයක් ද නැතිනම් සමුපකාර සමිති ද යන්න තීරණය කළ යුතුයි. පෞද්ගලික අංශය තනි පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සමාගම් ආදි විවිධ කණ්ඩායම්වලින් සමන්විත වී ඇත. මේ අනුව සමාජයේ කෘෂි කටයුතු, කර්මාන්ත, ධීවර කටයුතු හා වෙනත් සියලු නිෂ්පාදන අංශවල යෙදිය යුත්තේ කවුරුන් ද, කුමන ප්‍රමාණවලින් ද යන්න මෙහි දී තීරණය කළ යුතුයි.

## 3. කවුරුන් සඳහා නිපදවන්නේ ද?


පහත පින්තූරය අධ්‍යයනය කරන්න.



රූප සටහන 4.2

මෙයින් අදහස් වන්නේ ආර්ථිකය යම්කිසි කාල පරිච්ඡේදයක් තුළ නිෂ්පාදනය කරන භාණ්ඩ තොගය එහි විවිධ පුද්ගලයන් අතර බෙදා හරින්නේ කෙසේ ද යන්නයි. එම භාණ්ඩ සමාජයේ කවර ආදායම් ලබන අය සඳහා යොමු කරනවා ද යන්න තීරණය කළ යුතුයි. මීට පෙර සඳහන් කළ පරිදි සාධක සඳහා කරන ගෙවීම් එනම් වැටුප්, පොළී, බදුකුලී, ලාභ යන ආදායම් ලබාගන්නා ප්‍රමාණය අනුව ඒ ඒ පුද්ගලයන්ට ලබා ගත හැකි භාණ්ඩ ප්‍රමාණය තීරණය වේ.

## 4.1.4. ආර්ථික ක්‍රියා නිර්වචනය




රූප සටහන 4.3

ඉහත රූප සටහන අධ්‍යයනය කිරීමේ දී පෙනී යන්නේ ආර්ථිකයක් තුළ සිදුවන ක්‍රියාකාරකම් රාශියක් ඇති බවයි. ඒවා අතර වගා කටයුතු, කැනීම් කටයුතු, සකස් කිරීම්, ගබඩා කිරීම, වෙළෙඳාම, බෙදා හැරීම, පරිභෝජනය ආදි කටයුතු ඇත.

ආර්ථිකය සතු සීමිත සම්පත්වලින් අසීමිත අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීම සඳහා සමාජයක් තුළ කෙරෙන කටයුතු වර්ග තුනකට බෙදිය හැකි ය. එනම්:

1. නිෂ්පාදනය
2. හුවමාරුව
3. පරිභෝජනය

1. **නිෂ්පාදනය :** යනු අවශ්‍යතා හා වුවමනා ඉටු වන ආකාරයට ස්වභාව ධර්මයේ සම්පත් යොදා ගෙන එහි ස්වභාවය වෙනස් කිරීම හෝ අමුතුවෙන් ම සකස්කර ගැනීමයි. නිෂ්පාදනය කරන භාණ්ඩ ඒවායේ උපයෝජනය හෙවත් පාවිච්චි වන කාර්යය අනුව කොටස් දෙකකට බෙදේ. පරිභෝජන අවශ්‍යතා ඉටුකිරීම සඳහා යෙදවේ නම් පාරිභෝගික භාණ්ඩ ලෙසත් නිෂ්පාදන කාර්යය සඳහා යෙදවේ නම් නිෂ්පාදන භාණ්ඩ ලෙසත් කොටස් කළ හැකි ය.

   නිෂ්පාදන භාණ්ඩවලින් ඉටුවන කාර්යය අනුව ද ඒවා අන්තර් භාණ්ඩ හා ප්‍රාග්ධන භාණ්ඩ ලෙස කොටස් දෙකකට බෙදිය හැකි ය. කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම සඳහා කිසියම් ආකාරයකින් ඒ භාණ්ඩය තුළට ඇතුළු වීම අන්තර් භාණ්ඩවල (අතරමැදි) විශේෂ ලක්ෂණයකි. එසේ නැතහොත් නිපදවන භාණ්ඩ පෝෂණය කිරීමට අන්තර් භාණ්ඩ යොදා ගනී. අන්තර් භාණ්ඩ පාවිච්චි කළ හැක්කේ එක් වතාවක් පමණක් වීම එහි විශේෂ ලක්ෂණයකි. නිදසුනක් මගින් පැහැදිලි කළ හොත් කෘෂිකාර්මික කටයුතු සඳහා පොහොර භාවිතය ගත හැකි ය. ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදන කාර්යයේ දී නැවත නැවත යොදා ගත හැකි, කල් පවත්නා නිෂ්පාදන ආධාරක වේ. නිදසුනක් ලෙස ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර දැක්විය හැකි ය.

**ක්‍රියාකාරකම් 4.2**

පහත සඳහන් ලැයිස්තුව අධ්‍යයනය කර වගුව සම්පූර්ණ කරන්න.

මහාමාර්ග, වැව් අමුණු, මසා නිමකළ ඇඳුම්, පොහොර, සිමෙන්ති, ආහාර, කිරිපිටි, ක්‍රීඩා භාණ්ඩ, සංගීත භාණ්ඩ, කෘෂි රසායන ද්‍රව්‍ය, බස් රථ, නැව්, ගුවන් තොටුපොළ, ගොඩනැගිලි, කර්මාන්ත ශාලා, පාවහන්, රෙදි නිපදවීමට ගන්නා නූල්, රබර් ෂීට්.

| භාණ්ඩ වර්ග | අදාළ දේවල් |
|---|---|
| පාරිභෝගික භාණ්ඩ | |
| අන්තර් භාණ්ඩ | |
| ප්‍රාග්ධන භාණ්ඩ | |

2. **හුවමාරුව :** ආර්ථිකයක් තුළ සිදුවන අනෙක් වැදගත් ක්‍රියාවලිය හුවමාරුවයි. යැපුම් ආර්ථික ක්‍රමයක් තුළ තමාට අවශ්‍ය භාණ්ඩ තමා නිපදවා ගන්නා අතර භාණ්ඩවලට, භාණ්ඩ හුවමාරු කර ගැනීම ද සිදු විය. නමුත් නූතන සමාජයේ වෙළෙඳපොළ තුළ දී මුදල්වලට භාණ්ඩ හා සේවා හුවමාරු කරගැනීම බහුල ව සිදු වේ. වර්තමානයේ තාක්ෂණික දියුණුවත් සමඟ මුදල් පමණක් නො ව, මුදල් වටිනාකමක් ඇති කාඩ්පත් හා විද්‍යුත් මුදල්, ගනුදෙනු සඳහා යොදා ගනී.

   හුවමාරු කටයුතු දේශීය වෙළෙඳපොළ පමණක් නො ව පුළුල් විදේශීය වෙළෙඳපොළ දක්වා ව්‍යාප්ත ව තිබේ. වර්තමානයේ ලොව කිසිදු රටකට සෙසු රටවල් සමඟ භාණ්ඩ හා සේවා හුවමාරු කර ගැනීමෙන් තොර ව කටයුතු කිරීමට නොහැකි තත්වයක් උදා වී ඇත.

3. **පරිභෝජනය :** යන්නෙන් අදහස් කරන්නේ අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීම සඳහා භාණ්ඩ හා සේවා පාවිච්චියට ගැනීමයි. කෑම බීම, ඇඳුම් පැලඳුම් විනෝද අවස්ථා සංගීතය රස විඳීම, පුවත්පත් බැලීම, වෛද්‍ය ප්‍රතිකාර ගැනීම ආදි සියලු දේවල් පරිභෝජන භාණ්ඩ හා සේවා වේ. පුද්ගලයාගේ අවශ්‍යතා හා වුවමනා ඍජු ව සපුරන භාණ්ඩ මේ යටතට ගැනේ.

## 4.2 විවිධ අර්ථ ක්‍රම හඳුනා ගැනීම

(ධනවාදී, සමාජවාදී, මිශ්‍ර)

අර්ථ ක්‍රමයක් යනු මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා යම් සමාජයක් සංවිධානය වී ඇති ආකාරයයි. අර්ථ ක්‍රම බිහි වීමට මූලික පදනම වී ඇත්තේ රටක් පොදුවේ මුහුණ පාන මූලික ආර්ථික ප්‍රශ්නවලට විසඳුම් සොයන ආකාරයයි. ඒ අනුව අර්ථ ක්‍රම වර්ග තුනකි.

1. ධනවාදී අර්ථ ක්‍රමය
2. සමාජවාදී අර්ථ ක්‍රමය
3. මිශ්‍ර අර්ථ ක්‍රමය

### 4.2.1 ධනවාදී අර්ථ ක්‍රමය

ධනවාදී අර්ථ ක්‍රමයක ආර්ථිකය සතු දේපළ හා සම්පත්වල අයිතිය පෞද්ගලික අංශය යටතේ පවතී. නිදසුනක් ලෙස කර්මාන්ත ශාලා, භූමිය, ජලවිදුලි බලාගාර, යන්ත්‍ර උපකරණ, වාරිමාර්ග ආදී සියලු ධනෝපායන මාර්ග පෞද්ගලික අයිතිය යටතේ ඇත. ධනවාදි අර්ථ ක්‍රමයක දී ලාභ ලැබීමේ මූලික පරමාර්ථයෙන් මිල ක්‍රමය මත පදනම් ව ආර්ථික කටයුතු මෙහෙයවීම සිදුවන අතර වෙළෙඳපොළ බලවේග මඟින් (වෙළෙඳ පොළේ පවත්නා ඉල්ලුම හා සැපයුම) ඒවා විවිධ අංශ අතර බෙදා හැර ඇත. මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා තනි පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සීමිත සමාගම් වැනි පෞද්ගලික අංශයේ ආයතන සංවිධානය වී කටයුතු කරයි. මෙහි දී ඔවුන්ගේ මූලික අරමුණ උපරිම මට්ටමින් ලාභ ලැබීමයි. පවත්නා සම්පත් උපයෝගී කරගෙන කුමක්, කොපමණ, කෙසේ, කවුරුන් සඳහා නිපදවනවා ද යන්න තීරණය කිරීම මිල ක්‍රමය මත සිදු වේ. කුමක් කොපමණ නිපදවනවා ද යන ප්‍රශ්නයට මුහුණ දෙන ව්‍යවසායකයා ලාභ ලැබෙන දේ පමණක් නිපදවන අතර ලාභ නොලැබෙන දේ නිපදවීමට උත්සාහ නොකරයි. කෙසේ නිපදවිය යුතු ද යන ප්‍රශ්නයට විසඳුම් සෙවීමේ දී, උපරිම ලාභයක් ලැබෙන නිෂ්පාදන ශිල්පීය ක්‍රමය තෝරා ගනී. ශ්‍රම සූක්ෂ්ම හා ප්‍රාග්ධන සූක්ෂ්ම ක්‍රම අතුරින් නිෂ්පාදන පිරිවැය අවම වන ශිල්ප ක්‍රමය තෝරා ගනී. නිපද වූ භාණ්ඩ කවුරුන් සඳහා යොමු කරනවා ද යන්න තීරණය වනුයේ ද මිල ක්‍රමය මතයි. ඒ අනුව නිෂ්පාදන මිලදී ගැනීමට හැකියාව ඇති පාර්ශ්ව වෙත නිෂ්පාදන යොමු කරනු ලැබේ.

ධනවාදී අර්ථ ක්‍රමයක් තුළ ලාභ ඉපැයීමට ප්‍රමුඛ තැනක් ලැබෙන නිසාත් ආර්ථික කටයුතු පෞද්ගලික අයිතිය යටතේ පවතින නිසාත් සම්පත් බෙදී යාමේ අසමාන බවක් දක්නට ලැබේ. ඒ නිසා සමාජය තුළ ධනවත් හා නිර්ධන යන පන්ති භේදයක් ඇති කෙරෙන බවටත් ඇතැම් අය චෝදනා කරති. ප්‍රචාරණය ආදී උපක්‍රම මගින් පාරිභෝගිකයන් තම නිෂ්පාදන වෙතට ආකර්ෂණය ගැනීමට විවිධ උපක්‍රම අනුගමනය කරන නමුත් පාරිභෝගිකයාට ද තමා කැමති භාණ්ඩ හා සේවා තෝරා ගැනීමට නිදහසක් ඇත. පෞද්ගලික ව්‍යවසාය අර්ථ ක්‍රමය ලෙස ද මෙය හැඳින්වේ.

**ක්‍රියාකාරකම් 4.3**

1. ධනවාදී අර්ථ ක්‍රමයක මූලික ලක්ෂණ හතරක් සඳහන් කරන්න.
2. i. ධනවාදී අර්ථ ක්‍රමය ක්‍රියාත්මක වන රටවල් 5 ක් නම් කරන්න.
   ii. ලෝක සිතියම් පොත ආධාර කරගෙන ඔබ නම් කළ රටවල් හඳුනාගෙන ආදර්ශ ලෝක සිතියමක ලකුණු කරන්න.
3. ධනවාදී අර්ථ ක්‍රමයක වාසි හා ධනවාදී අර්ථ ක්‍රමයක අවාසි වගුවක් මගින් ඉදිරිපත් කරන්න.

### 4.2.2 සමාජවාදී අර්ථ ක්‍රමය

සමාජවාදී අර්ථ ක්‍රමයක් පවතින රටවල නිෂ්පාදන සම්පත්වල අයිතිය රජය සතු වේ. නිෂ්පාදන හා හුවමාරු කටයුතු සිදුකරන්නේ ද ලාභ ඉපයීම මූලික පරමාර්ථය සේ සලකා නො ව, සමාජ සුභසාධනය උපරිම වන ආකාරයටයි. මෙහි දී මධ්‍යගත සැලසුම් මණ්ඩලයක් මගින් ආර්ථික කටයුතු සැලසුම් කර ක්‍රියාත්මක කෙරේ. මෙවැනි ලක්ෂණ ඇති රටවල් මධ්‍යගත සැලසුම් ආර්ථික ඇති රටවල් ලෙසත් හඳුන්වනු ලැබේ.

**ක්‍රියාකාරකම් 4.4**

1. සමාජවාදී අර්ථ ක්‍රමයක මූලික ලක්ෂණ 4 ක් සඳහන් කරන්න.
2. සමාජවාදී අර්ථ ක්‍රමය ක්‍රියාත්මක වූ රටවල් 5 ක් නම් කරන්න.
3. දැනට සමාජවාදී අර්ථ ක්‍රමය ක්‍රියාත්මක වන රටවල් සොයා ලෝක සිතියමක ලකුණු කරන්න.

### 4.2.3 මිශ්‍ර අර්ථ ක්‍රමය

ධනවාදී හා සමාජවාදී යන ලක්ෂණ දෙකෙන් ම සමන්විත වන අර්ථ ක්‍රම මිශ්‍ර අර්ථ ක්‍රම නමින් හැඳින්වේ. දේපොළ හා සම්පත් හිමිකම පෞද්ගලික හා රාජ්‍ය දෙඅංශය ම සතු ය. පෞද්ගලික ව්‍යවසායකයා ලාභ පරමාර්ථයෙන් ද, රජය සමාජ සුභසාධන පරමාර්ථයෙන් ද කටයුතු කරයි. මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා රජය හා පෞද්ගලික යන අංශ දෙක ම කටයුතු කරයි. ලෝකයේ වැඩි රටවල් ප්‍රමාණයක ඇත්තේ මෙම ලක්ෂණ සහිත අර්ථ ක්‍රමයන් ය. ඇතැම් රටවල රජයේ මැදිහත් වීම වැඩිපුර දක්නට ලැබේ. සමහර අවස්ථාවල එක්

එක් කාල වකවානු අනුව එම අංශවල බලපෑම අඩු වැඩි වශයෙන් ක්‍රියාත්මක වේ.

පැවරුම 4.1

ඉහත සාකච්ඡා කළ අර්ථ ක්‍රමවල විශේෂ ලක්ෂණ ඇසුරින් ශ්‍රී ලංකාවේ අර්ථ ක්‍රමය පිළිබඳ ව සංසන්දනාත්මක ව සොයා බලන්න. ඒ අනුව පාසල් වාර සඟරාවට ලිපියක් සකස් කරන්න.

## 4.3 වෙළෙඳ පොළ ආර්ථික සංකල්පය

මෑත කාලීන දශක දෙක තුනක කාලයක් තිස්සේ ලෝක ආර්ථික රටාවේ ඇතිවෙමින් පවතින ප්‍රවණතාව වන්නේ වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමයයි. බොහෝ රටවල් ආර්ථික සංවර්ධන උපාය මාර්ගය ලෙස මෙම ක්‍රමය අනුගමනය කිරීමට පෙළඹී සිටී. සමාජවාදී ක්‍රමය ක්‍රියාත්මක වූ රටවල් කිහිපයක් සිය ආර්ථික රටාව වෙනස්කම්වලට භාජන කරමින්, වෙළෙඳ පොළ ආර්ථිකය බවට පත් වී තිබේ. නිදසුන් ලෙස රුසියාව, චීනය, පෝලන්තය ආදි රටවල් දැක්විය හැකි ය. මෙසේ වෙළෙඳ පොළ ආර්ථිකය බවට පත්වීමට බලපෑ හේතු රාශියකි.

1. මිනිස් අවශ්‍යතා හා වුවමනා සඳහා නිපදවිය යුතු "දහසකුත් එකක්" නිෂ්පාදන ප්‍රායෝගික ව තීරණය කිරීම අපහසු වීම.
2. තරඟකාරී බවක් දක්නට නොමැති නිසා නව නිෂ්පාදන බිහිකිරීමට (නවෝත්පාදන) උත්සාහ නොකිරීම.
3. පාරිභෝගිකයාට තමන් කැමති දේ තෝරා ගැනීමට ඇති නිදහස (පාරිභෝගික ස්වාධිපත්‍යය) අහිමි වීම.
4. පැවති තත්ත්වය තුළ ක්‍රියාත්මක වූ තීරණ ගැනීමේ අනම්‍ය ක්‍රමය නිසා නිෂ්පාදනය, බෙදාහැරීම ආදි කටයුතුවල දී ප්‍රමාද ඇති වීම.

ආර්ථිකයක් මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා ඉල්ලුම් සැපයුම් බලවේග (වෙළෙඳ පොළ ක්‍රියාකාරීත්වය) මත ලැබෙන මිල පදනම් කරගෙන ආර්ථික තීරණ ගන්නා ආර්ථික ක්‍රමය වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමය ලෙස හැඳින්වේ. කිසිවකුගේ මෙහෙයවීමක් නැතිව ආර්ථික ප්‍රශ්නවලට මිල ක්‍රමය මගින් විසඳුම් සොයයි.

වෙළෙඳ පොළ ක්‍රමයේ පරමාර්ථය පෞද්ගලික ලාභයයි. එය ස්වාර්ථය ලෙස හැඳින්වේ. ඒ අනුව ලාභ ලැබෙන දේ නිපදවන අතර ලාභ නොලැබෙන දේ නිපදවීමට ඉදිරිපත් නො වේ. භාණ්ඩ නිෂ්පාදනය කිරීමට වැයවන මිලට (පිරිවැය මිලට) වඩා වෙළෙඳපොළ මිල වැඩි නම් විශාල වශයෙන් ලාභ ලැබෙන නිසා එය තෝරා ගනී. ඒ අනුව ලාභ ලැබෙන අංශ වෙත සම්පත් ගලා යයි.

### වෙළඳපොළ ආර්ථික ක්‍රමයේ අහිතකර ලක්ෂණ

1. සෘණ බාහිරතා ගැන අවධානය යොමු නොකිරීම. සෘණ බාහිරතා යනු, කිසියම් නිෂ්පාදන හෝ පාරිභෝජන කටයුත්තක් එම ක්‍රියාවට සම්බන්ධ නැති වෙනත් පාර්ශ්වයක් මත ඇති කරනු ලබන බලපෑමයි. වෙළෙඳපොළ ක්‍රමය තුළ පරිසර දූෂණය වැනි සෘණ බාහිරතා ඇතිවිය හැකි ය.

   නිදසුන් ලෙස - කර්මාන්ත ශාලාවක් නිසා අවට පරිසරයට සිදුවන හානිය ගත හැකි ය.

2. ලාභ ලැබීමේ අරමුණ මත පමණක් පිහිටා කටයුතු කරන නිසා ජනතාවගේ සුභ සාධනයට හේතුවන භාණ්ඩ නිෂ්පාදනය කිරීමට ඉදිරිපත් නොවීම.

3. පුද්ගලයන් අතර ආදායම් බෙදී යාමේ විෂමතාවක් පැවතීම.

4. භාණ්ඩ අලෙවි කර ගැනීමට අධික ප්‍රචාරණයක් සිදුකරන නිසා පාරිභෝගිකයාගේ මිලදී ගැනීමේ අවස්ථාවන්ට බලපෑම් සිදුවීම.

**ක්‍රියාකාරකම් 4.5**

- වෙළෙඳ පොළ අර්ථ ක්‍රමයක් තුළ ඔබට හඳුනා ගත හැකි යහපත් හා අයහපත් ලක්ෂණ දෙක බැගින් පැහැදිලි කරන්න.

## 4.4 ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික ක්‍රමය හා සංවර්ධනය

ශ්‍රී ලංකා ආර්ථිකය තුළ 1977 ට පෙර සමාජවාදී ලක්ෂණවලට නැඹුරු වූ මිශ්‍ර ආර්ථික ක්‍රමයක ස්වරූපය දක්නට ලැබුණි. ආර්ථික කටයුතු සඳහා රාජ්‍ය අංශයේ වැඩි මැදිහත් වීමක් දක්නට ලැබුණි. කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන සියලු අංශවල දී රාජ්‍ය අංශයේ සහභාගිත්වය කැපී පෙනුණි. 1971 ව්‍යාපාර අත්පත් කර ගැනීමේ පනත මඟින් තව දුරටත් රාජ්‍ය ව්‍යවසාය වැඩි කරනු ලැබී ය. දේශීය සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගෙන ආර්ථික සංවර්ධනය ළඟා කරවීම සඳහා දේශීය අමුද්‍රව්‍ය පදනම් කරගත් කර්මාන්ත මෙන් ම කෘෂි අංශය නගා සිටුවීමට ද රජය කටයුතු කළේ ය.

1977 න් පසු දේශීය ආර්ථික ප්‍රතිපත්තිවල කැපී පෙනෙන වෙනස්කම් සිදුකරනු ලැබී ය. වෙළෙඳපොළ ආර්ථික ප්‍රතිපත්තිය යටතේ පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඇති කිරීම හා දිරිගැන්වීම සඳහා පියවර ගන්නා ලදී. මේ සඳහා උචිත කර්මාන්ත ආරක්ෂා කිරීමට මෙතෙක් පනවා තිබූ තීරු බදු ඉවත් කරනු ලැබී ය. බදු ප්‍රතිපත්තිය සරල කළ අතර නිදහස් වෙළෙඳාමට පුළුල් ඉඩකඩ ලබා දීමට පියවර ගත්තේ ය. මේ සඳහා විදේශීය ආයෝජකයන් ගෙන්වා ගැනීමට විවිධ දිරිගැන්වීම් ලබා දෙන ලදී. 1978 මහ කොළඹ ආර්ථික කොමිසම (1992 සිට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නමින් හැඳින්වේ.) මඟින් නිදහස් වෙළෙඳ කලාප පිහිටුවීමට පියවර ගන්නා ලදී. ඒ අනුව කටුනායක, බියගම, කොග්ගල නිදහස් වෙළෙඳ කලාප ආරම්භ කරනු ලැබීය.

රජය මඟින් මහවැලි බහු කාර්ය යෝජනා ක්‍රමය කඩිනම් කරමින් දේශීය කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය සඳහා ජලය සැපයීම, ජල විදුලිබල උත්පාදනය, රැකියා ලබා දීම, ඉඩම් නැති අයට ඉඩම් ලබා දීම වැනි අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළේ ය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ආයෝජකයන් වෙත ලබා දෙන ලද වරප්‍රසාද හා සහන නිසා රටවල් විශාල ප්‍රමාණයකින් ආයෝජකයන් ශ්‍රී ලංකාවට පැමිණ ඇත. අපනයන දිරිගැන්වීම් හා තීරු බදු සහන නිසාත් දේශීය සම්පත් හා ශ්‍රමය කර්මාන්ත සඳහා යොදා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දීම නිසාත් විදේශීය ආයෝජකයෝ විශාල ලෙස රට තුළට පැමිණ කර්මාන්ත ආරම්භ කළහ. මේ නිසා ප්‍රාග්ධන හිඟයට පිළියම් ලැබුණු අතර නව රැකියා අවස්ථා උදා වීම හා විදේශීය තාක්ෂණික දැනුම ද ලැබුණි. දේශීය වශයෙන් වරාය ගුවන් තොටුපළ, මහාමාර්ග, විදුලි සංදේශ කටයුතු ආදි යටිතල පහසුකම් වැඩි දියුණු වීම ආර්ථික සංවර්ධනයට හේතු විය.

1990 දශකයේ අග භාගය වන විට රජය විසින් පෞද්ගලිකරණය කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම නිසා කෘෂිකාර්මික හා කාර්මික ක්ෂේත්‍රයේ ආයතන හා කර්මාන්ත විශාල සංඛ්‍යාවක් පෞද්ගලීකරණය කර ඇත. මේ සඳහා නිදසුන් කිහිපයක් පහත දක්වේ.

**පෞද්ගලීකරණ වැඩ සටහනෙහි ක්‍රියාකාරිත්වය**

| රාජ්‍ය ව්‍යවසායේ නම | පෞද්ගලීකරණය කරන ලද ප්‍රතිශතය | පෞද්ගලීකරණය කළ දිනය |
|---|---|---|
| **කෘෂිකාර්මික** | | |
| • සීමාසහිත බොගවන්තලාව වැවිලි සමාගම. | 100 | 1995 සැප්. |
| • සීමාසහිත කෑගල්ල වැවිලි සමාගම. | 100 | 1995 ඔක්. |
| • සීමාසහිත වටවල වැවිලි සමාගම. | 100 | 1996 ජන. |
| • හිඟුරක්ගොඩ බිත්තර වී ගොවිපොළ වත්කම් විකිණීම. | | 1998 ජූලි. |
| • සෙවණගල සීනි සමාගම. | 100 | 2002 ජුනි. |
| **කර්මාන්ත** | | |
| • තුල්හිරිය රෙදි කම්හල. | 100 | 1990 පෙබ. |
| • සීමාසහිත ලංකා ලෝහ. | 100 | 1991 ඔක්. |
| • සීමාසහිත ලංකා සෙරමික්. | 100 | 1992 ජුනි. |
| • සීමාසහිත රුහුණු සිමෙන්ති. | 85 | 1993 ජන. |
| • ප්‍රීමා සිලෝන් ලිමිටඩ්. | 100 | 1991 ජුනි. |
| **අනෙකුත්** | | |
| • සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම්. | 50.5 | 1997 අගෝ. |

වගුව 4.1

## ක්‍රියාකාරකම් 4.6

1. මහ බැංකු වාර්තාව අධ්‍යයනය කරමින් පෞද්ගලීකරණය කරන ලද රාජ්‍ය අංශයේ ආයතන හා කර්මාන්ත පිළිබඳ තොරතුරු රැස් කරන්න.

2. කර්මාන්ත ප්‍රාදේශීය වශයෙන් විමධ්‍යගත කිරීමට 1990 න් පසු ගත් ක්‍රියාමාර්ග ආර්ථික සංවර්ධනයට විවිධ ආකාරයෙන් දායක විය. නිදසුන් ලෙස

- ඇඟළුම් කම්හල් 200 වැඩ සටහන
- කර්මාන්ත පුර ඇති කිරීම
- කර්මාන්ත උද්‍යාන ඇති කිරීම

මෙම ක්‍රියාමාර්ග රටවැසියාගේ යහපතට හේතු වූ ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

## ක්‍රියාකාරකම් 4.7

1. ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන

- කර්මාන්ත පුර
- කර්මාන්ත උද්‍යාන
- අපනයන සැකසුම් කලාප
- අපනයන ගම්මාන

පිළිබඳ තොරතුරු එක් රැස් කරමින් පොත් පිංචක් සකස් කරන්න.

2. කර්මාන්ත පුර, කර්මාන්ත උද්‍යාන, අපනයන සැකසුම් කලාප, අපනයන ගම්මාන පිහිටුවා ඇති ස්ථාන ශ්‍රී ලංකා සිතියමක ලකුණු කර නම් කරන්න.

1977 න් පසු ආර්ථික ප්‍රතිපත්තිවල වෙනස්කම් අනුව දළ දේශීය නිෂ්පාදනයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය පහළ වැටී ඇති අතර කර්මාන්ත අංශයේ දායකත්වය වැඩි වී ඇත. එමෙන් ම සේවා අංශයේ දායකත්වය කර්මාන්ත අංශයේ දායකත්වයට වඩා වැඩි වී ඇත.

**දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික, කාර්මික හා සේවා අංශයේ දායකත්වය**

| වර්ෂය | කෘෂිකාර්මික අංශයේ ප්‍රතිශතය | කාර්මික අංශයේ ප්‍රතිශතය | සේවා අංශයේ ප්‍රතිශතය |
|---|---|---|---|
| 1977 | 26.7 | 22.5 | 50.1 |
| 1996 | 18.4 | 30.4 | 51.2 |
| 2004 | 17.9 | 26.4 | 55.7 |
| 2005 | 17.2 | 27.0 | 55.8 |
| 2009 | 12.0 | 28.6 | 59.3 |

වගුව 4.2

එමෙන් ම අපනයන ආදායමට කෘෂිකාර්මික අපනයනවලින් සිදු වූ දායකත්වය පහළ වැටී ඇති අතර කාර්මික අංශයේ දායකත්වය ශීඝ්‍රයෙන් වැඩි වී ඇත. 2004 න් පසු ක්‍රියාත්මක කරන ලද කෘෂිකාර්මික අංශයේ සංවර්ධන උපාය මාර්ග තුළින් එම අංශයේ දායකත්වය ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙන්වා ඇත.

| අපනයන ආදායමට කෘෂිකාර්මික හා කාර්මික අපනයන අංශවල දායකත්වය | | |
|---|---|---|
| වර්ෂය | අපනයන ආදායම සඳහා කෘෂි: අපනයන දායකත්වය % | කාර්මික අපනයන ආදායම් දායකත්වය % |
| 1977 | 79.3 | 18.5 |
| 2004 | 14.2 | 78.3 |
| 2005 | 18.2 | 78.0 |
| 2009 | 23.9 | 74.9 |

වගුව 4.3

**ක්‍රියාකාරකම් 4.8**

- මහ බැංකු වාර්තාව (2004 න් පසු) ඇසුරින් කෘෂිකාර්මික, කාර්මික, සේවා යන අංශ යටතට ඇතුළත් අයිතම වර්ග කරන්න.

ඉහත තොරතුරු අනුව 2004 වර්ෂයේ කාර්මික අංශයේ වර්ධනය සඳහා හේතු වූ කරුණු රාශියකි.

නිදසුන් ලෙස

- අපනයන වෙළෙඳ පොළ අභිමුඛ කර්මාන්තවල යහපත් ක්‍රියාකාරිත්වය
- දේශීය පාරිභෝගික ඉල්ලුම ඉහළ යාම.
- විදුලි සංදේශ, වරාය, තොරතුරු තාක්ෂණය ආදී යටිතල පහසුකම්වල වර්ධනය
- රටට සාමය ළඟා කර ගැනීම පිළිබඳ බලාපොරොත්තු සහගත තත්ත්වයක් පැවතීම.

ආර්ථික වර්ධනය ඉහළ යාම කෙරෙහි සේවා අංශයේ දායකත්වය ද වැදගත් වේ. ඒ අතර තොග හා සිල්ලර වෙළෙඳාම, හෝටල් හා ආපන ශාලා, ගබඩා කිරීම හා සන්නිවේදනය හා මූල්‍ය සේවා ආදිය වැදගත් වේ.

රට සංවර්ධනය කරා ගෙන යාමේ දී ආර්ථික අංශය පමණක් නො ව සමාජයීය හා සංස්කෘතික අංශ ද ඉතා වැදගත් වේ. සෙසු සංවර්ධනය වෙමින් පවතින රටවල් සමඟ සසඳන කළ ශ්‍රී ලංකාවේ සමාජයීය අංශය ඉහළ අගයක් පෙන්නුම් කරයි. එය සංවර්ධිත රටවල දත්තවලට සමීපතාවක් පෙන්වයි. විසි එක්වන සියවසේ විශේෂ අවධානය යොමු කර ඇත්තේ ධරණීය (තිරසාර) සංවර්ධනයක් ළඟා කර ගැනීම කෙරෙහි ය.

**ධරණීය සංවර්ධනයක් යනු**
**සංවර්ධනය, තුළින් අනාගත පරම්පරාවන්ට ඔවුන්ගේ වුවමනාවන් සපුරා ගැනීමට ඇති හැකියාව සීමා නොකර, වර්තමාන වුවමනාවන් සපුරා ලීමට ක්‍රියා කළ යුතු බව යි.**

තිරසාර සංවර්ධනය ළඟා කරගැනීම අරමුණු කරගෙන ආර්ථික ප්‍රතිපත්ති සකසා ගැනීමට රජය උනන්දු වී ක්‍රියාකරයි.

2000 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ දී එක්සත් ජාතීන්ගේ සහශ්‍රක සමුළුවේ දී ලෝක නායකයන් එක් වී දිළිඳුකම, ලෙඩ රෝග, නූගත්කම හා කාන්තාවන්ට එරෙහි වෙනස්කම් පිටු දැකීම සඳහා කිසියම් කාල සීමාවක් මත සකසා ගත් අභිමතාර්ථ හා ඉලක්ක පද්ධතියක් පිහිටුවා ගෙන ඇත.

පැවරුම 4.2

2000 සැප්තැම්බර් මස පැවති එක්සත් ජාතීන්ගේ සහස්‍රක සමුළුවේ දී ලෝක නායකයන් එකඟ වූ සහස්‍රක අභිමතාර්ථ 8 සොයා සටහන් කරගන්න.

සහස්‍ර අරමුණු කරා ළඟා වීමට ක්‍රියා කිරීමේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික අරමුණු ද ඊට අනුකූල සේ ගළපා ගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව සංවර්ධන ඉලක්ක කරා ගමන් කිරීමේ දී අප ලබාගෙන ඇති ජයග්‍රහණ පිළිබඳ ව සතුටු විය හැකි ය.

**ශ්‍රී ලංකාවේ සංවර්ධනය සම්බන්ධයෙන් පවත්නා තත්ත්වය**

1. දිළිඳු ජන සංඛ්‍යා අනුපාතය 1990/91 වර්ෂයේ දී සියයට 26.1ක් වූ අතර 2002 දී එය 22.7 කී. 2006/2007 15.2 කි.
2. 2000/2001 වර්ෂයේ දී ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ඇතුළත් වූ ප්‍රතිශතය සියයට 97 කී. 2002 දී 97.9 කි.
3. 1990 වසරේ වයස අවුරුදු 5ට අඩු මරණ අනුපාතය සජීවී උපත් දහසකට 23ක් වූ අතර 2001 දී එය 19 දක්වා අඩු විය. 2003 දී එය සජීවී උපත් දහයකට 11.1 දක්වා අඩු වී ඇත. 2006 දී එය 10 දක්වා අඩු වී ඇත.
4. පිරිසිදු පානීය ජලය ලැබෙන පවුල් සංඛ්‍යාව 1990 දී සියයට 62ක් වූ අතර 2000 දී සියයට 70ක් දක්වා ද 2005 වර්ෂයේ දී සියයට 92 දක්වා ද ඉහළ ගොස් ඇත.
5. 2000 වර්ෂයේ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය ඇමරිකානු ඩොලර් 813ක් වූ අතර 2004 වර්ෂයේ දී එය 1030ක් විය. 2005 වර්ෂයේ ඇ. ඩොලර් 1103 කි. 2009 දී එය ඇ. ඩොලර් 2029 කි.
6. අකුරු ලිවීමේ කියවීමේ හැකියාව (සාක්ෂරතාව) 1996/97 වර්ෂයේ සියයට 88.6ක් වූ අතර 2000 වර්ෂයෙන් පසුව එය සියයට 90ට වැඩි අගයක් ගනී.

7. සංවර්ධනය මැනීමේ නූතන දර්ශකයක් සේ ගැනෙන මානව සංවර්ධන දර්ශකය අනුව ද ශ්‍රී ලංකාව මධ්‍ය සංවර්ධිත රටක් සේ සැලකේ. රටවල් 177 ක් අතුරින් ශ්‍රී ලංකාව 93 වැනි ස්ථානයේ පසුවේ. 2007 දර්ශක අනුව රටවල් 182ක් අතරින් ශ්‍රී ලංකාව 102 ස්ථානයේ පසු වේ.

පවත්නා තත්ත්වයන් තව දුරටත් සංවර්ධනය කර ගැනීම සඳහා දිළිඳුකම පිටුදැකීම, සේවා වියුක්තිය අඩු කිරීම සහ තිරසාර පදනමක් මත ජීවන තත්ත්වය ඉහළ නැංවීම අවශ්‍ය බව ශ්‍රී ලංකා මහ බැංකු වර්තාව පෙන්වා දෙයි. අපේක්ෂිත ආර්ථික සංවර්ධනය ළඟා කර ගැනීම සඳහා එන යෝජනා, රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ විස්තර කර ඇත. ඒ අනුව සංවර්ධන උපාය මාර්ග ලෙස ක්‍රියාත්මක කිරීමට ආරම්භ කර ඇති නව සංවර්ධන වැඩ සටහන් කිහිපයකි.

නිදසුන් ලෙස

- දහසක් වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩ සටහන
- නැණසල වැඩ සටහන
- ගැමි දියවර
- මහ නැඟුම
- ගම නැඟුම
- සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සඳහා ණය යෝජනා ක්‍රම
- පොහොර සහනාධාරය දීම ආදිය දැක්විය හැකි ය

සංවර්ධනය කරා ගමන් කිරීමේ දී ලෝක වෙළෙඳ පොළේ තරඟකාරීත්වය, තෙල් මිල ඉහළ යාම වැනි ගැටලු ද බාධක ලෙස බලපායි.

## ක්‍රියාකාරකම් 4.9

1. පුවත්පත්, සඟරා ඇසුරින් නව සංවර්ධන වැඩ සටහන් පිළිබඳ වාර්තාවක් සකස් කරන්න.
2. සංවර්ධනය කරා ගමන් කිරීමේ දී මුහුණ දීමට සිදුවන ගැටලු හා ඒවා විසඳීමට ඔබ විසින් කරනු ලබන යෝජනා සම්බන්ධයෙන් කථාවක් ඉදිරිපත් කරන්න.

## 4.5 තාක්ෂණික දියුණුව, ගෝලීයකරණය හා ශ්‍රී ලංකාව

### 4.5.1. තාක්ෂණික දියුණුව



වර්තමාන තාක්ෂණික දියුණුව විදහා දක්වෙන පින්තූර සමූහයක්

ඉහත දක්වෙනුයේ තාක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් නිර්මාණය වී ඇති නවීන නිෂ්පාදන කිහිපයකි. තාක්ෂණික දියුණුව නිසා මිනිසාගේ වැඩ කටයුතු ඉතා පහසුවෙන් කළ හැකි ව තිබේ. අපේ මුතුන් මිත්තන් සිහිනෙන්වත් නොසිතූ දේවල් අද නිපදවා ඇත. මිනිසාගේ සිතුවිලිවල ඇති වූ වෙනසට තාක්ෂණය පසුබිම් වී ඇත.


අනාදිමත් කාලයක සිට දිගු ගමනක් පැමිණ සිටින මිනිසා, අද භුක්ති විඳින තාක්ෂණික පහසුකම් ළඟා කරගෙන ඇත්තේ ඉතා අසීරුවෙන් ය. දඩයම් යුගය, එඬේර යුගය හා ගොවි යුගය තුළ තාක්ෂණික දියුණුවේ මූලික ලක්ෂණ ක්‍රමයෙන් අත් විඳි අතර මිනිසාගේ සිතුවිලිවල ඇති වූ වෙනසත් සමඟ එය පෝෂණය වී ඇත. ගංගා නිම්න ශිෂ්ටාචාර, පැරණි ග්‍රීක රෝම ශිෂ්ටාචාර ආදියේ තිබූ විද්‍යාත්මක හා තාක්ෂණික දියුණුව පිළිබඳ ව ඔබ මීට පෙර ඉගෙන ගෙන ඇත. පහළොස් වැනි සියවසේ යුරෝපයේ ඇති වූ කාර්මික හා විද්‍යා පුනරුදයේ ප්‍රතිඵලයක් ලෙස නව දැනුම හා තාක්ෂණය සොයා ගැනීම ඉතා වේගයෙන් සිදු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස දේශ ගවේෂණය ඔස්සේ නව වෙළෙඳ මාර්ග සොයා ගැනීම හා රටවල් සොයා ගැනීම සිදු විය. මිනිසුන් තමන්ගේ එදිනෙදා වැඩකටයුතු කිරීමට වැඩි ශ්‍රමයක් වැය කළ අතර ඒ සඳහා වඩා පහසු හා කාලය පිරිමසා ගත හැකි ක්‍රම හා උපකරණ සොයා ගෙන ඇත. මේ ගමන් මඟ ඔස්සේ තව දුරටත් ඉදිරියට යමින් තාක්ෂණ යුගයකට එළඹී මිනිසා, මුළු ලෝක ප්‍රජාව කෙරෙහි ම විවිධ අංශවලින් බලපෑම් කිරීමටත්, විශ්වය ම එක ම ගම්මානයක් බවට පත් කිරීමටත් සමත් වී ඇත.

තාක්ෂණයේ ප්‍රතිඵල අත් විඳින අවස්ථා කිහිපයක් ඔබගේ පන්තියේ මිතුරන් සමඟ සාකච්ඡා කරන්න.

- එංගලන්තයේ හෝ නවසීලන්තයේ පැවැත්වෙන ක්‍රිකට් තරඟයක් ගෙදර සිට නැරඹීම.
- මිතුරකු සමඟ ඊ මේල් පණිවිඩ මඟින් සම්බන්ධ වීම.

- අන්තර් ජාලයෙන් දිනපතා පුවත්පත් කියවීම.
- ලෝකයේ විවිධ රටවල නිෂ්පාදනය කළ භාණ්ඩ පරිභරණය කිරීම, තාක්ෂණයේ ප්‍රතිඵල අතරින් කිහිපයකි.

තාක්ෂණය අද ඉතා ප්‍රබල ලෙස ලොව සියලු අංශ කරා පැතිරී ඇත.




නවීන යුධ උපකරණ හා අවි ආයුධ නිපදවීම වැනි සමාජයට හානිදායක අංශ කරා ද තාක්ෂණය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම කනගාටුවට කරුණකි. තාක්ෂණය මිනිස් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස මිනිස් වැඩ කටයුතු පහසු කර ගැනීමට ඉවහල් වී ඇති සේ ම පරිසර දූෂණය, මිහිතලය උණුසුම් වීම, ලෝක යුධමය වාතාවරණය උග්‍ර වීම වැනි අහිතකර තත්ත්වයන් ඇති කිරීමට ද හේතු වී තිබේ.

පැවරුම් 4.4

"තාක්ෂණය මිනිසාගේ දියුණුවට මෙන් ම විනාශයට ද හේතු වී ඇත." යන මාතෘකාව යටතේ ගුරුතුමාගේ සහය ඇති ව විවාදයක් පවත්වන්න.

ලෝකයේ රටවල් සංවර්ධනය කරා ගමන් කිරීමට මූලික හේතුව තාක්ෂණික දැනුම ලබා ගැනීම හා සිය ආර්ථික කටයුතු සඳහා යොදා ගැනීමයි. නිෂ්පාදනය කරන ලද යන්ත්‍ර සූත්‍ර හා උපකරණවල කාර්යක්ෂමතාව ද ඉතා ශීඝ්‍ර ලෙස වැඩි වී ඇත.

නිදසුන් ලෙස

- අධ්‍යාපනය ලැබීමට නව දැනුම සොයා යාමට අන්තර් ජාලය සම්බන්ධ කිරීම.
- මිනිත්තුවකට පිටපත් සිය ගණනක් මුද්‍රණය කර ගත හැකි මුද්‍රණ යන්ත්‍ර නිපදවීම.
- වෛද්‍ය සේවාවන් ලබා ගැනීමට අන්තර් ජාලය හරහා පහසුකම් සලසා ගැනීම.
- අති විශාල දත්ත හා තොරතුරු ගබඩා කර තැබීමට ඉතා සියුම් උපකරණ නිපදවා තිබීම ආදිය මේ තාක්ෂණික දියුණුවෙහි අංශු මාත්‍රයක් ලෙස දැක්විය හැකි ය.

### 4.5.2. ගෝලියකරණය හා ලෝක ආර්ථිකය ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කරන බලපෑම

තාක්ෂණික දියුණුවත් සමඟ මුළු ලෝකය ම සමීප වී ඇති බව ඔබට වැටහේ.

**ගෝලීයකරණය යනුවෙන් අදහස් කරන්නේ මුළු ලොව ම එකම ගම්මානයක් හෙවත් විශ්ව ගම්මානයක් බවට පත් වීමයි. තාක්ෂණික වශයෙන් ලබා ගත් දියුණුව එක් එක් ක්ෂේත්‍රවලට විකාශනය වීමෙන් අංශ රාශියක පුළුල් දියුණුවක් හා ව්‍යාප්තියක් සිදු ව ඇත.**

**සන්නිවේදනය, ප්‍රවාහනය, විදේශ වෙළඳාම, විදේශ ආයෝජන ආදි ක්ෂේත්‍ර ඔස්සේ ලෝකයේ රටවල් තනි ආර්ථිකයක් ලෙස ඒකාබද්ධ වීමේ ප්‍රවණතාවක් ඇත. රටවල් තුළ දේශ සීමා බිඳී ගොස් මිනිසුන් එක ම භාෂාවක් කථා කරන, එක ම සංස්කෘතියක් ඇති, එක ම මූල්‍ය ඒකකයක් මගින් ගනුදෙනු කරන තත්ත්වයට සංකෝචනය වෙමින් පවතී.**

පසුගිය වර්ෂ කිහිපය තුළ දක්නට ලැබුණු තොරතුරු තාක්ෂණයේ අධිවේගී දියුණුවත් සමඟ පෙරමුණ ගත් රටවල් විසින් දේශපාලනමය වශයෙන් සමීප සම්බන්ධතා ගොඩ නඟා ගැනීම හේතුවෙන් සමාන ආර්ථික එකමුතු බවක් බිහි වී ඇත. ලොව ම එක ම වෙළෙඳ පොළක් බවට පත් වී ඇත.

ලෝක ආර්ථිකය දෙස අවධානය යොමු කළහොත් ලෝකය ම තනි ආර්ථිකයක් ලෙස හැඩ ගැසෙමින් පවත්නා බව පෙනේ. නිදසුන් ලෙස, ශ්‍රී ලංකාව තේ නිපදවන්නේ අපට පමණක් නො වේ. ඇමෙරිකා එක්සත් ජනපදයේ තිරිඟු හෝ මැද පෙරදිග කලාපයේ තෙල් නිපදවෙන්නේ ඔවුන්ට පමණක් නො වේ. ලෝකයේ සෙසු රටවලටත් එම නිෂ්පාදන බෙදා හැරේ. සෑම රටක් ම තම අවශ්‍යතා සපුරා ගැනීමට සෙසු රටවල නිෂ්පාදන හුවමාරු කර ගැනේ. එසේ ම ලෝක වෙළෙඳ පොළ තුළ සිදුවන හැම සිදුවීමක් ම සෙසු රටවල ආර්ථිකයට බලපෑම් ඇති කරයි. ලෝක වෙළෙඳ පොළේ ඛනිජ තෙල් මිල වෙනස් වීම ශ්‍රී ලංකා ආර්ථිකයට ද දැඩි සේ බලපෑම් ඇති කිරීම දැක්විය හැකි ය. මෙය ගෝලීයකරණයේ ප්‍රතිඵලයකි.

ගෝලීයකරණය ලෝක ආර්ථිකය කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ ව තව දුරටත් සාකච්ඡා කළ හොත් ජාත්‍යන්තර දේශ සීමාවන් දියුණු ගුවන් සේවා ඔස්සේ විවෘත වීම නිසා මිනිසුන්ට නිදහසේ සංචාරය කිරීමට ද අවස්ථාව සැලසී ඇත. එමඟින් අලුත් අදහස් අලුත් සංස්කෘතීන් පිළිබඳ අත්දැකීම් හුවමාරු කරගැනීමට අවස්ථාව ලැබී ඇත. ශ්‍රී ලංකාවේ ශ්‍රමිකයන් මැද පෙරදිග රටවලට ඇදී යාම නිදසුනක් ලෙස ගත හැකි ය. ගෘහ සේවිකාවන්, ජුකි මැෂින් ක්‍රියාකරවන්නියන්, රියදුරන්, තාක්ෂණිකයන් ආදි රැකියා අවස්ථාවලට වැඩි අවධානය යොමු වූ අතර වර්තමානයේ බුද්ධිමතුන් විදේශගත වීම ද ප්‍රවණතාවකි. ගෝලීයකරණය නිසා අද පරිගණක තාක්ෂණිකයන්, දත්ත සැකසුම් ශිල්පීන් හා වෛද්‍යවරුන් ඉංජිනේරුවන් ආදී ප්‍රවීණයන්ට රැකියා අවස්ථා වඩ වඩාත් විවෘත වී ඇත. එනිසා ලෝකයේ සෑම මහද්වීපයක් වෙතට ම සංක්‍රමණය වීමේ අවස්ථා ද උදා වී ඇත.

ජාත්‍යන්තර වෙළෙඳාමේ දී අද ලොව පුරා ගනුදෙනු වන්නේ ඇමෙරිකානු ඩොලර්, යුරෝ, බ්‍රිතාන්‍ය පවුම්, ජපාන යෙන් ආදි මුදල් වර්ගයි. මෙයින් පැහැදිලි වන්නේ ජාත්‍යන්තර ගනුදෙනුවල දී පොදු මුදල් ඒකක භාවිත කිරීමට යොමු ව ඇති බවයි. යුරෝපා සංගමයේ රටවල් යුරෝ භාවිත කරමින් එක ම භාෂාවක් කථා කරමින් තනි ආර්ථිකයක් ලෙසට එකතු වීමට සාර්ථක ප්‍රයත්නයක් දරමින් සිටී.

එමෙන් ම ලෝක වෙළෙඳ පොළ පුළුල් වීමත් සමඟ රටවල් අතර තිබූ දූරස්ථභාවය අඩු වීම හේතුවෙන් රටවල් අතර වෙළෙඳ ගිවිසුම් හා කලාපීය සංවිධාන බිහි වී ඇත. යුරෝපා ආර්ථික හවුල, සප්තා ගිවිසුම, සාර්ක් සංවිධානය, ආසියාන් සංවිධානය මේවාට නිදසුන් ය. එමෙන් ම ජාත්‍යන්තර ගනුදෙනු සඳහා ලෝක වෙළෙඳ සංවිධානයේ මැදිහත් වීම ද රටවලට බලපායි. මේවා නිසා රටවල් අතර වෙළෙඳාමට තිබූ බාධක ඉවත් වී ඇත.

ජාත්‍යන්තර ආර්ථික සංවර්ධනය සමඟ යමින් ශ්‍රී ලංකාව ද 1977 න් පසු ආර්ථික ප්‍රතිපත්තිවල වෙනස්කම් ඇතිකරනු ලැබී ය. මේ තුළින් පෞද්ගලික ආයෝජකයන් හා බහු ජාතික සමාගම් අප රට තුළ ආයෝජනය කිරීමට ඉදිරිපත් වූ අතර ඒ සඳහා විවිධ පහසුකම් රජය මගින් ලබා දී ඇත. අපනයන ප්‍රවර්ධන කලාප පිහිටුවීම ද එහි එක් පියවරකි. නිෂ්පාදන ගෝලීයකරණයේ එක් අංශයක් මෙලෙස අපේ රටේ අද ක්‍රියාත්මක වේ.

පසුගිය වසර කිහිපය තුළ ලෝක ආර්ථිකයේ කැපී පෙනෙන ප්‍රවණතාවක් වූයේ නිෂ්පාදන අංශයේ ඇති වූ ගෝලීයකරණයයි. ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපය, ජපානය යන ලොව ප්‍රමුඛ රටවල බහු ජාතික සමාගම් වර්ධනය වී ඇත. ලාභය උපරිම කර ගැනීම සඳහා ඔවුන් අනුගමනය කළ ප්‍රතිපත්ති කිහිපයකි.

1. නිෂ්පාදන පිරිවැය අවම මට්ටමක පවත්වා ගැනීම.
2. ශීඝ්‍රයෙන් වෙනස් වන වෙළෙඳ පොළට සුදුසු ලෙස නිෂ්පාදනය කිරීම.
3. නවීන විද්‍යාව හා තාක්ෂණය උපයෝගි කර ගෙන නිර්මාණශීලී ව නිෂ්පාදන ඉදිරිපත් කිරීම.

බහුජාතික සමාගම්වලට සම්බන්ධ එක් එක් අංශ එක් එක් රටවල ස්ථාපිත කර ඇත. සංවර්ධනය වෙමින් පවතින රටවල ආයෝජකයන් බදු සහන, පාරිසරික ප්‍රතිපත්ති, අඩු වැටුප් වැනි වාසිදායක තත්ත්වයන් සැලකිල්ලට ගෙන ඇත.

2005 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන (UNDP) සැකසූ මානව සංවර්ධන වාර්තාව අනුව රටවල් 177 ක් අතුරින් ඉහළ මානව සංවර්ධන දර්ශකයන් ඇති රටවල් 57ක් හඳුනා ගෙන ඇත. ඒ අතරින් ප්‍රථම රටවල් දහය මෙසේ ය. මේ රටවල් ගෝලීයකරණය තුළ ඉහළ ප්‍රතිඵල භුක්ති විඳින රටවල් ය.

1. නෝර්වේ
2. අයිස්ලන්තය
3. ඕස්ට්‍රේලියාව
4. ලක්ස්ම්බර්ග්
5. කැනඩාව
6. ස්වීඩනය
7. ස්විට්සර්ලන්තය
8. අයර්ලන්තය
9. බෙල්ජියම
10. ඇමෙරිකා එක්සත් ජනපදය

මේ සියලු රටවල් සංවර්ධිත රටවල් ලෙස හඳුනා ගෙන ඇත. පළමු රටවල් 20 ගත හොත් ඒ තුළ 11 වැනි ස්ථානයේ සිටින ජපානය එක ම ආසියාතික රටයි. මධ්‍ය සංවර්ධිත රටක් ලෙස ශ්‍රී ලංකාව හිමි කරගෙන ඇති ස්ථානය 93 වේ. මානව සංවර්ධන දර්ශකය අනුව පහළ සංවර්ධන මට්ටමේ සිටින රටවල් 26ක් හඳුනා ගෙන ඇත. ඒ අතරින් රටවල් 25ක් ම අප්‍රිකානු රටවල් ය. මේ අනුව පෙනී යන්නේ ගෝලීයකරණ ප්‍රතිඵල, තවදුරටත් සංවර්ධනයෙන් අඩු රටවලට බෙදී යා යුතු බවයි.

ගෝලීයකරණය මත ශ්‍රී ලංකාවට සැලසී ඇති යහපත් ප්‍රතිඵල කිහිපයක් මෙසේ දැක්විය හැකි ය.

1. විදේශීය වෙළෙඳ පොළ තුළට කර්මාන්ත අංශය යොමු වීම නිසා විදේශීය තාක්ෂණය හා ආයෝජනයන් ගලා ඒම. දේශීය සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ අවස්ථාව උදා වීම හා සේවා වියුක්ති ප්‍රශ්නයට විසඳුමක් ලැබීම.
2. දේශීය කෘෂි නිෂ්පාදන සඳහා නව වෙළෙඳ පොළ සොයා ගැනීමට අවස්ථාව ලැබීම හා විදේශ විනිමය ඉපැයීම් ඉහළ යාම.
3. විදේශ රටවල් කරා වූ ශ්‍රම ගලනය සීමා කරමින් බුද්ධිමතුන් සඳහා විවිධ, නව රැකියා අවස්ථා උදා වීම.
4. දේශීය වෙළෙඳ පොළේ නව තාක්ෂණික මෙවලම්, උපකරණ හා භාණ්ඩ සුලභ වීම නිසා දේශීය පරිභෝජන රටාවන් වෙනස් වීම හා භාණ්ඩ මිල ගණන් එයට සාපේක්ෂ ව පහළ වැටීම.
5. කලාපීය වෙළෙඳ ගිවිසුම් හා සංවිධාන තුළ ක්‍රියාත්මක වන නිදහස් තීරුබදු ප්‍රතිපත්ති මත භාණ්ඩ හුවමාරුවට අවස්ථාව ලැබීම නිසා ව්‍යාපාරිකයන්ට වැඩි පහසුකම් ලැබීම.
6. නව තාක්ෂණික උපකරණ හා සන්නිවේදන අංශයේ ශීඝ්‍ර දියුණුව ඔස්සේ දෙස් විදෙස් සම්බන්ධතා වැඩි වී ඇත. ලෝකය ඉතා නවීන වී ඇත. නව අධ්‍යාපන අවස්ථා ලැබී ඇත. නිද: නිවසේ සිට ම අන්තර්ජාලය ඔස්සේ ඉගෙනීමට පුළුවන. මේ සියල්ල තුළින් ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යාම හා ගුණාත්මක බව වැඩි දියුණු වීම ශුභවාදී ප්‍රතිඵලයකි.

ගෝලීයකරණය සුළඟක් සේ ලෝකය හරහා හමා යයි. සියලු ජාතීන් එහි බලපෑමට ලක්වන අතර සුළඟ හමන දෙසට ගමන් කිරීමට සැම දෙනාට ම සිදු වේ. එහි දී එක් එක් රටවලට ඇති වන අහිතකර තත්ත්වයන්ට විසඳුම් සෙවීමට ද ලෝක නායකයින් උත්සාහ දරා ඇත. ලෝකය දෙසට විවෘත වීමත් සමග නිෂ්පාදනය හා සම්පත් භාවිතය ශීඝ්‍ර ලෙස වැඩි වී ඇත. මේ නිසා පරිසරය ආරක්ෂා කිරීම පිළිබඳ වැඩි අවධානයක් යොමු වී ඇත. ජනතාවගේ නුගත්කම නිසා මුහුණ දෙන එච්.අයි.වී., ඒඩ්ස් වැනි අවදානම් තත්ත්වයන් පිළිබඳ දැනුවත් කිරීමට ලෝක සංවිධාන මට්ටමින් ක්‍රියාකරමින් සිටී.

පැවරුම් 4.5

1. ගෝලීයකරණය තුළින් ශ්‍රී ලංකා ආර්ථිකයට හා ජන ජීවිතයට සිදු වී ඇති බලපෑම් පිළිබඳ ව තොරතුරු රැස් කරන්න.

2. ගෝලීයකරණය නිසා සංවර්ධනය වන රටවලට ඇති වාසිදායක හා අවාසිදායක තත්ත්වයන් වගු සටහනකින් ඉදිරිපත් කරන්න.

   - ඔබ හඳුනාගත් අවාසිදායක තත්ත්වයන් මගහරවා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කරන්න.